

# වැටෙන් එහා



වැටෙන් එහා මල් පඳුරේ
ඔබ පිපී වැනේ අත නුදුරේ
මිලින වුණත් ගණ අඳුරේ
මල් නෙළන්න නම් තහනම්.......

සුවඳ ඇදෙයි මුළු ලොවට හොරෙන්
නොවසා ඇති දොර කවුළු තුළින්
සුවඳ දිදී තිබුණත් විදුලේ
මල් නෙළන්න නම් තහනම්.......

පෙඟුණත් දෙකොපුල් උනු කඳුළින්
ඇසුණත් කෙඳිරිය මුදු මුවගින්
පිපුණ නිසා අන් සතු උයනේ.....
මල් නෙළන්න නම් තහනම්.

*ගායනය:* දයාන් විතාරණ
*සංගීතය:* ආචාර්ය රෝහණ වීරසිංහ
*රචනය:* මහාචාර්ය සුනිල් ආරියරත්න

හුදෙකලා තරුණ සිත්වලට පියඹා යන්නට ඇති ඉඩකඩනම් අසීමිතයි. ආදරයේ සුවඳ ඉවකරමින් අනන්තයකට වුණත් ඉගිලී යන්න ඕන වෙන්නේ අසුරු සැණයක් විතරමයි යොවුන් සිතකට. ඒ තරමටම නො ඉවසිලිමත්. පොපියන සිතක් අද්දරම ආදරයේ සුවඳ විහිදවන මලක්......

ඒ මේ ආදර සිතැති යෞවනයාගේ නිවහනට යාබදව ම. වැටක් විතරමයි මේ සුවඳ විහිදුවන මලක් වැනි යෞවනියත්, යෞවනයාත් අතර ඇත්තේ. එකම ගැටළුවත් මේ වැටමයි. වැටෙන් එහා වුවත් මල පිපී වැනෙන්නේ තරුණයාගේ අත නුදුරේමයි. නෙළා ගන්න බොහොමත්ම පහසුයි. සුවඳ විහිදුවන මේ යෞවනියගේ සිත තමා වෙත ආශක්ත බව තරුණයාට වැටහෙනවා හෙළින් ම. ඇය තමන්ට හිමි කර ගැනීමේ කිසිදු අපහසුවක් නැති. ඒත් වැටෙන් එහා ඇති අන්සතු පාරාදීසයකට සීමා වුණ දෙයක් නතු කර ගැනීම නම් තහනම්. මේ සුවඳ විහිදන මල නෙළාගන්නට තහංචියක්. තහංචි පැනවෙන්නේ නීතියෙන්. හිතකට බලපෑමක් ඇති කරවන්න සවියක් නැතත්, තහංචි පනවන නීතිය මේ තරම් බලවත් ඇයි? ඇය අන් සතු විවාහක කාන්තාවක්....! ඇය නීතියෙන් හිමි අයැගේ සැමියාට.

මුළු ලොවටම හොරෙන් මේ විවාහක කාන්තාව තමන්ගේ ආදරයේ සුවඳ විහිදුවන්නී, සිය නිවහනේ දොර කවුළු හැර පියා තරුණයාට ඉඟි කරමින් ඇරයුම් කරන්නා සේ ය. එලෙසින් සුවඳ දිදී තිබුණත් එය හිමි කර ගැනීම නම් සිතනු නොහේ. එය නීතියෙන් පැනවුණ තහංචියක්.

නිසි ආදරයක් සිය සැමියාගෙන් නො ලබන නිසා දෝ, ඔහු බැහැරක නිසා දෝ ඉන් හුදෙකලා වූ දුකින් මේ විවාහක කාන්තාව හෙළනා කඳුළින් ඇයගේ දෙකොපුල් පෙඟෙනා අයුරු තරුණයාට පෙනෙනා - නොපෙනනා සේය. ඒ මුදු මුවින් නැගෙන කෙඳිරිලි හැඬුම් හඬ තරුණයාට ඇසෙනා - නොඇසෙනා මානයේය. ඒත් ඇය අනුන් සතු උයනක පිපිණු මලක්. ඒ නිසාම මල් නෙලන්න නම් තහනම්.

මේ ආර්ථාන්විත සරළ පද රචනාවේ 'වැට', රූපකයක් ලෙස ඇරඹුමේ දීම අපූර්වත්වයක් එක් කරවයි. තරුණිය මලකට උපමා කිරීම පසු බිමෙහි ලා ඇය රූපකයක් ලෙසින් ඇමතෙන්නේ 'පිපී වැනෙයි' දෙවදන් නිසාවෙන්. විවාහ බන්ධනයක් සමගින් ඇති වෙන නීති රීති සියල්ල 'තහනම්' තනි වදනින් ගෙන හැර දක්වන්නට ගේය පද නිබන්ධකයාණන් සමත්. 'පැදුරේ', 'නුදුරේ', 'අඳුරේ', වැනි ශබ්ද මාධූර්යය නංවන මුල් තෙපදවල වදන් 'රේ' අක්ෂරයෙන් එළිසමය ද පුරයි. එද අවසන් පදය ඒ රීතිය බිඳිමන් ස්වායක්තව 'තහනම්' බවේ තිර සාර බව උද්දීපනය කරවයි.

අන්තරා දෙකොටසේත් මුල් දෙපද අග එළි සමය රකින්නට ගේය පද නිබන්ධකයාණන් යොදා ගන්නේ 'න්' ව්‍යංජනාක්ෂරයයි. අන්තරා දෙකොටසේ ම තෙවන පදය 'ඒ' ශබ්දය නංවන්නේ තනු නිර්මාණකරුවාට යම් ඉඟියක් දෙමින්. තෙවන පද දෙකේදිම 'පිපුණ නිසා', 'සුවඳ දිදී', දෙපද නිසා ගී පද රචනා සැකිල්ලේ තවත් විශේෂත්වයක් ඉස්මතු වෙයි. අන්තරා දෙකොටසම නිමා කරනා සිව්වන පදය වෙනේනේ ස්ථායි කොටසේ සිව්වැන්න මයි. ඒ තරමට ම තිරසාරයි ඒ පදය. ගී පද රචනාව පුරාවටම:

'මල් නෙළන්න නම් තහනම්' මෙවන් අරුත් බර අගනා පද රචනාවක් ගෙත්තම් කරන්නේ දිවයිනේ ප්‍රවීණත ම ගේය පද නිබන්ධක වරයෙකු වන මහාචාර්ය සුනිල් ආරියරත්නයන්. කිසිවෙකුට නො දෙවෙනි වන සේ අති විසල් පරාසයක ගී පද නිබන්ධන කාර්යයෙහි නිමග්නව සිටිනා මහාචාර්යවරයාණන් ගීය කවියෙන් ස්වායක්ත වන්නේ කෙලෙසින් ද යන වග නිවැරදිව අර්ථකථනය කරනා විද්වතාණානන් වෙයි. විවිධාකාර වූ මාතෘකා, අනුභූතීන් යටතේ, විවිධාකාර වූ ගේය පද රචනා සැකිලිවලට, විවිධාකාර වූ ශිල්පීන් වෙනුවෙන් ගී පද රචනා කරනා සුනිල් ආරියරත්න මහාචාර්යවරයාණන්ගේ සාහිත්‍යම ය දැණුමත්, මියැසිම ය දැණුමත් මේ විවිධත්වය ට බෙහෙවින්ම බලපා ඇති බව පෙනී යයි.

පොපියන තාරුණ්‍යයේ සිතුවිලි උද්දීපනය කරවන ලෙසින් බටහිර තාල වාද්‍ය කට්ටලයේ රිද්මයටත්, ගිටාර් සහ සරපුවරු මියැසි රටා වලටත් අනුව ගැයෙන මේ ගීයේ සංගීත නිර්මාතෘවරයා වන්නේ ආචාර්ය රෝහණ වීරසිංහයන්. නැගී එන නවකයින් ඉහළින්ම හිඳුවා තබන්නට බෙහෙවින්ම උපකාර වූ ආචාර්ය රෝහණ වීරසිංහයන්ගේ මියැසි රටා මෙන් ම තනු නිර්මණයකරණය 'වැටෙන් එහා' ගීය ද රසික සවනේ සදා නිම්නාද කරනා ගීයක් බවට පත් කර වූ සේය.

ගී පද නිබන්ධකයාණන් සිය පද රචනාවෙන් බලාපොරොත්තු වූ සේම ඉහළින් ගැයීම ඇරඹෙන තනුව, ස්ථායි කොටසේ අග දී මන්ද්‍රාව, තිර සාරව ගැයෙයි.

'මල් නෙළන්න නම් තහනම්.......' එය ම අන්තරා කොටස්වල අග පදයේ තනුව ලෙසටත් ගලපා ගැනීමයි අරුමය. 'සුවඳ දි දී' 'පිපුණ නිසා' යන අන්තරා කොටසේ තෙවන පදයේ සමතැන් ගන්නා දෙපද ද , දෙවර බැගින් ගැයෙන්නට රෝහණ වීරසිංහයන් තනුව නිර්මාණය කිරීමත් විශේෂයක්.

ගීය ගයන්නට හඬ දායකත්වය, තමන්ට ම ආවේනික හඬ පෞරුෂත්වයකින් හෙළ ගායන ශිල්පි පරපුරට එක් වුණ දයාන් විතරණ යොවුන් ගායන ශිල්පියාණන්ගෙන්. ඉතාම හැඟිම් බරව, පැහැදිලිව වචන උසුරුවමින් ගයනා දයාන් විතාරණ ශිල්පියාණන් මුළු මහත් කලා ලොවට ම පානා දයාර්ද බව සිය ගායනයෙන් ද මුදවාලන්නේ පද පෙළට අගේට සමවදිමින්. මේ අන් කිසිවෙකු නොව, දයාන් විතාරණ ප්‍රවීණ ඡායාරූප ශිල්පියාණන් ම යි.



සිසිර දිසානායක